# දෙවියන් වහන්සේ හා නිර්මාණය

දෙවියන් වහන්සේ විසින් දෙවියන් වහන්සේ නිර්මාණය කරනු ලැබිය නොහැකි ද යන ප්‍රශ්නයට පිළිතුර උන්වහන්සේ ඇත්තට ම ඇතැයි යනුවෙන් ගන්නේ ද නැත් ද යන්න මත රඳා පවතියි. උන්වහන්සේ ඇත්තට ම නැත්නම් සමහර විට මනස විසින් මනස ඇතිකරනු ලබන්නේය වැනි පිළිතුරක් දීමේ හැකියාව වෙයි. එහෙත් දෙවියන් වහන්සේ ඇත්තට ම ඇතැයි ගතහොත් එවිට සියල්ල උන්වහන්සේගෙන් නතර වෙයි. එහි තේරුම නම් දෙවියන් වහන්සේ තමන් වහන්සේ හැර අන් සියල්ල නිර්මාණය කරන මුත් තමන් වහන්සේ නිර්මාණය නොකරන බව ය.

මෙහි සියල්ල නිර්මාණය කෙළේ ය යනුවෙන් අදහස් කෙරෙන්නේ දෙවියන් වහන්සේ තමන් වහන්සේ ම සියල්ල නිර්මාණය කෙළේ ය යන්නට වඩා සියල්ල නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික ද්‍රව්‍ය ද, සියල්ල නිර්මාණය කිරීමට අවශ්‍ය සැලැස්ම ද නිර්මාණය කෙළේ ය යන්න ය. උදාහරණයක් ලෙස ගතහොත් පුටු මේස ආදිය හෝ අද පවතින ගස් සතුන් ආදිය හෝ නිර්මාණය කරනු ලබන්නේ දෙවියන් වහන්සේ විසින් නො වෙයි. එහෙත් උන්වහන්සේ පළමු සතුන්, ආදම් හා ඒව, පළමු ගස් හා ප්‍රජනන ක්‍රම ආදියත් මිනිසුන්ට පුටු හා වෙනත් දෑ නිර්මාණය කිරීමේ හැකියාවත් නිර්මාණය කිරීමෙන් අද පවතින ගස් ආදියත් අද ජීවත්වන මිනිසුනුත් පුටු ආදියත් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සියල්ල නිර්මාණය කර ඇත.

දෙවියන් වහන්සේ යනු කාගේ හෝ නිර්මාණයක් නම් ඉන් කියැවෙන්නේ එසේ නිර්මාණය කිරීමට පෙර දෙවියන් වහන්සේ නොසිටි බවත් එහෙත් එසේ නිර්මාණය කළ තැනැත්තා සිටි බවත් ය. එසේ ගතහොත් දෙවියන් වහන්සේ සියල්ල නිර්මාණය කෙළේ ය යන්න අසත්‍යයක් වෙයි. සියල්ල නිර්මාණය කිරීම පිළිබඳ අර්ථ නිරූපණය කුමක් වුවත් දෙවියන් වහන්සේ වෙනත් අයකු විසින් නිර්මාණය කරනු ලැබී යැයි ගතහැකි නො වෙයි. එවිට දෙවියන් වහන්සේට ද වඩා පළමුවැන්නෙක් ලෝකයේ පවතියි.

එවිට අපට පිළිගැනීමට සිදුවන්නේ දෙවියන් වහන්සේ ඇත්තට ම ඇති බැවින් කාගේ හෝ නිර්මාණයක් නොවී පවතින බව ය. දෙවියන් වහන්සේ ගැන පමණක් නොව බ්‍රහ්මන් ගැන පවා කිව හැක්කේ එවැන්නකි. බ්‍රහ්මන් සම්බන්ධයෙන් ගත්කල ලෝකය හා බ්‍රහ්මන් යනු එකක් බව ද බ්‍රහ්මන් ලෝකයෙන් වෙන්කිරීමට නොහැකි බව ද තේරුම් ගතයුතු ය. එසේ තිබිය දී ද මූල හේතුවක් ගැන කතාකරන විට ඒ මූල හේතුව ඵලයක් ලෙස ගෙන වෙනත් හේතුවක් දීමට නොහැකිකම ප්‍රශ්නයක් වෙයි.

දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේගේ ම නිර්මාණයක් ලෙස සැලකිය නොහැක්කේ යුදෙව් චින්තනයෙහි පමණක් නොව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ද දෙවියන් වහන්සේ ඇත්තට ම පවතින ලෙස ගැනීම නිසා ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි හේතු සොයන්නේ බොහෝ විට ඒ චින්තනයෙහි ඇත්තට ම පවතින්නේ යැයි ගනු ලබන වස්තු හා එහි ගුණ සඳහා ය. ඇත්තට ම නැතැයි කියන දෑහි පවා අඩු තරමින් හේතුව ඇත්තට ම පවතින්නක් වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පොල් ගෙඩියක් ඇත්තට ම පවතින බවත් එය ඇත්තට ම පොළොවට වැටෙන බවත් පිළිගැනෙයි. මිනිසුන් හිටියත් නැතත්, පොල් ගෙඩි හා පොල් ගෙඩි වැටෙනු නිරීක්ෂණය කිරීමට මිනිසකු හෝ වෙනත් නිරීක්ෂකයකු හෝ සිටියත් නැතත්, පොල් ගෙඩි ඇති බවත් ඒ පොල් ගෙඩි වැටෙන බවත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පිළිගැනෙයි. එසේ නම් පොල් ගෙඩි වැටීමට හේතුව කුමක් දැයි අසනකල ඉන් විමසෙන්නේ ඇත්තට ම සිදුවන ක්‍රියාවකට හේතුව කුමක් ද යන්න ය. එවිට ඒ හේතුව ද ඇත්තට ම පවතින්නක් ලෙස ගැනීමට සිදුවෙයි. බොහෝ දෙනා ගුරුත්වාකර්ෂණ බලයක් (ක්ෂේත්‍රයක්) ඇත්තට ම ඇතැයි පිළිගන්නේ එබැවින් ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඇත්තට ම පවතින පොල් ගෙඩි ඇත්තට ම පවතින ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රයක වැටෙයි.

ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සියල්ල ඇත්තට ම පවතින්නේ යැයි ගැනෙනවා ද නො වෙයි. එහෙත් එලෙස ඇත්තට ම නොපවතින්නේ යැයි ගැනෙන දේට පවා හේතු සොයන්නේ ඇත්තට ම පවතින්නේ යැයි ගැනෙන දේ ඔස්සේ ය. අපට උදාහරණයක් ලෙස හොල්මන් ගත හැකි ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි හොල්මන් යනුවෙන්

© Prof. Nalin De Silva

ඇත්තට ම සංසිද්ධියක් නැතැයි ගත්ත ද එසේ හොල්මන් පෙනීම විස්තර කෙරෙන්නේ ඇති බවට සැලකෙන මනස ඔස්සේ ය. මනසේ යම් වෙනස්වීමක් නිසා හොල්මන් පෙනෙන්නේ යැයි තේරුම් කිරීමට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් ව කටයුතු කරන්නෝ උත්සාහ කරති. ඔවුහු මනසේ එලෙස යම් යම් භ්‍රාන්ති ඇතිවීමට ද ඇත්තට ම පවතින හේතු සොයති. මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඵලය හොල්මන් මෙන් ඇතැම් විටක ඇත්තට ම නොපවතින්නක් වුව ද හේතුව ඇත්තට ම පවතින්නක් බව ය.

එවිට සියල්ලෙහි ම මුල හේතුව ඇත්තට ම පවතින්නක් විය යුතු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. දෙවියන් වහන්සේ ඇත්තට ම පවතින්නේ යැයි ගැනෙයි. ඇත්තට ම පවතින්නකට තමන් ම නිර්මාණය කරගැනීමට නො හැකි ද යන්න අපට විසඳාගත යුතුව ඇති ප්‍රශ්නය වෙයි. මෙහි දී ගැටළුව වනුයේ නිර්මාණය කිරීමට නම් එය යම් අවස්ථාවක හෝ නො පැවතිය යුතු වීම ය. තමන් ම නිර්මාණය කරගත්ත ද වෙනත් අයකු නිර්මාණය කළ ද නිර්මාණය කෙරෙන්න එසේ නිර්මාණය කිරීමට පෙර නො පවතියි. මෙහි දී පෙර යන වචනය යොදාගැනීම සම්බන්ධයෙන් යමකුට විරුද්ධ විය හැකි ය. කාලය යන්න දෙවියන් වහන්සේගේ නිර්මාණයක් බැවින් දෙවියන් වහන්සේ කාලය මැවීමට පසුව පමණක් පෙර හා පසු සංකල්ප ඇතැයි තර්ක කිරීමට හැකිවෙයි. කාලය මැවීමට පෙර, පෙරක් නැත යන්න මේ තර්කයෙහි හරය වෙයි. එය එසේ වුවත් නිර්මාණයක් කෙරෙන්නේ නිර්මාණයක් නැති බැවින් යැයි වෙනත් තර්කයක් ගොඩනගා ගත හැකි ය. ඒ තර්කයට පෙර හා පසු යන සංකල්ප අවශ්‍ය නො වෙයි. කාලයක් නැති වුව ද ඒ තර්කය වලංගු වෙයි. දෙවියන් වහන්සේ නිර්මාණය කිරීමට නම් දෙවියන් වහන්සේ නැති විය යුතු ය.

මෙහි දී දෙවියන් වහන්සේ ඕපපාතික ව පහළ නොවී ද යන ප්‍රශ්නය ද ඇසිය හැකි ය. දෙවියන් වහන්සේ යනු තමන් වහන්සේගේ ම නිර්මාණයක් නොවුණ ද, දෙවියන් වහන්සේට ඕපපාතික ව පහළ වීමේ හැකියාවක් ඇත. බෞද්ධ සාහිත්‍යයෙහි දෙවියෝ (දෙවියන් වහන්සේ නොව) ඕපපාතික ව පහළ වෙති. එහෙත් දෙවියන් වහන්සේ ඕපපාතිකව පහළ වීම යැයි කීම සිංහල බෞද්ධ චින්තනයක ගතහැකි වුව ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ගතහැකි නො වෙයි. එක් අතෙකින් දෙවියන් වහන්සේ ඕපපාතිකව පහළ වී යැයි ගැනීම උන්වහන්සේට කරන මදි පුංචිකමකි. අනෙක් අතට දෙවියන් වහන්සේ ඕපපාතික ව පහළ වන්නේ කොහේ ද යන ප්‍රශ්නය නැගීමට සිදුවෙයි. සිංහල බෞද්ධ චින්තනයෙහි දෙවිවරු ඕපපාතිකව පහළ වන්නේ එක්කෝ භූමාටු දෙවියන් ලෙස පවතින ලෝකයක ය. එසේත් නැත්නම් දිව්‍ය ලෝකවල ය. ඒ දිව්‍ය ලෝක ද දෙවියන් ඕපපාතිකව පහළ වීමට පෙර සිටම පවතියි.

එහෙත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි දෙවියන් වහන්සේට ඕපපාතිකව පහළ වීමට හැකිකමක් නැත. එයට හේතුව දෙවියන් වහන්සේට ඕපපාතික ව පහළ වීමට උන්වහන්සේ  විසින් නිර්මාණය කෙරුණු ලෝකයක් නොතිබීම ය. ලෝකය නිර්මාණය කරනු ලබන්නේ දෙවියන් වහන්සේ විසින් බැවින් කාලය පිළිබඳ කිනම් අර්ථකථනයක් දුන්න ද උන්වහන්සේ පහළවන තුරු ලෝකයක් තිබිය හැකි නො වෙයි. මෙහි දී කිව හැකි එක් කරුණක් නම් ලෝකය ද දෙවියන් වහන්සේ ද එකට නිර්මාණය වූ බව ය. දෙවියන් වහන්සේ ඕපපාතික ව පහළ වන විට ලෝකය ද ඒ හා සමග පහල විණි යැයි කතාවක් ගොඩනැගිය හැකි ය. එය බ්‍රහ්මන් හා සම්බන්ධ ලෝක නිර්මාණයට තරමක් සමීප වුව ද එහි දී ලෝකය මැවීම පිළිබඳ ගෞරවය  දෙවියන් වහන්සේගෙන් උදුරාගැනීමක්  සිදුවන බව පෙනී යයි. එය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සමග සංගත නො වෙයි.

මේ සියල්ලෙන් පෙනී යන්නේ ඇත්තට ම ඇතැයි යනුවෙන් ගැනෙන විට තමන් ම තමන් නිර්මාණය කරන්නේ යැයි ගැනීමට නොහැකි බව ය. සිංහල ථෙරවාදී බෞද්ධ චින්තනයෙහි මේ ගැටළුව නැත. එහි මනස යනුවෙන් යමක් ඇත්තට ම නැත. මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේ යැයි කී විට එහි දී නැති මනසක් ඇති මනසක් ලෙස ගැනීමක් කියැවෙයි. නැති මනස ඇති මනසක් ලෙස ගැනෙන්නේ ඇති මනසක් ලෙස ගන්නා නැති මනසකින් ය. මනස ඇත්තට ම පවතින්නේ නම් එවිට මනසට මනස නිර්මාණය කිරීමට නො හැකිවෙයි. එසේ නිර්මාණය කිරීම දෙවියන් වහන්සේ විසින් දෙවියන් වහන්සේ නිර්මාණය කරනු ලැබීම වැනි ක්‍රියාවක් වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මූල හේතු සොයයි. එය ඒක රේඛීය චින්තනයක් වෙයි. සිංහල බෞද්ධ චින්තනය චක්‍රිය වෙයි. එය මූල හේතු නො සොයයි.

එපමණක් නො වෙයි. බොහෝ දෙනා එතරම් සැලකිල්ලක් නොදක්වන කරුණක් වෙයි. මෙය අපේ විද්‍යාවක් හා අපේ ප්‍රවාද ගොඩනගා ගැනීමේදී ද වැදගත් වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හේතු සොයන්නේ බොහෝ විට ඒ

චින්තනයට අනුව ඇත්තටම පවතින දේ සඳහා ය. එනම් ඇත්තට ම පවතින ඵල සඳහා ය. ඒ හේතු සැම විට ම ඇත්තට ම පවතින හේතු ලෙස ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සැලකෙයි. ඇතැම් ඵලයක් ඇත්තට ම නොපැවතුණ ද එහි හේතුව නම් ඇත්තට ම පවතියි. මූල හේතුව වූ දෙවියන් වහන්සේ කිසිම හේතුවක ඵලයක් නොවී හේතුවක් ලෙස පමණක් ඇත්තට ම පවතියි.

එහෙත් සිංහල බෞද්ධ චින්තනයෙහි මේ සියල්ල මෙයට වඩා වෙනස් ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පිටුපස යන ඇතැම් බෞද්ධයන් කුමක් කීව ද සිංහල බෞද්ධ හේතුඵල දහම ඇත්තේ සංස්කාර ධර්ම සඳහා ය. සංස්කාර ධර්ම හැරෙන්නට වෙනත් ධර්ම පිළිබඳ හේතුඵළ දහමක් ගැන සිංහල බෞද්ධ චින්තනයෙහි නො කියැවෙයි. සංස්කාර ධර්ම යනු සංස්කරණය නිසා ඇතිවන ධර්ම ය. ඒ ධර්ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අනුව කියන්නේ නම් ඇත්තට ම පවතින ධර්ම නො වෙයි. ඒ සියළු ධර්ම මනස විසින් සකස් කෙරී ඇති මනසට සාපේක්‍ෂ ධර්ම වෙයි. සංස්කාර ධර්මයකට හේතුවක් වන්නේ තවත් සංස්කාර ධර්මයකි. සංස්කාර ධර්මයක ඵලය තවත් සංස්කාර ධර්මයකි. පොළොව මෙන් ම පොල් ද සංස්කාර ධර්ම වෙයි. පොල් වැටීම ද සංස්කාර ධර්මයකි. පොල් වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට දෙන එක් පිළිතුරක් වූ ගුරුත්වාකර්ෂණ ක්‍ෂෙත්‍රය ද සංස්කාර ධර්මයකි. ගුරුත්වාකර්ෂණ ක්‍ෂෙත්‍රය සංස්කාර ධර්මයක් වීම නිසා එය “ඇත්තට” ම පවතින  ධර්මයක් නො වෙයි. සිංහල බෞද්ධයන්ට එතරම් පහසුවෙන් ගුරුත්වාකර්ෂණ ක්‍ෂෙත්‍රයක් “ඇත්තට” ම නැතැයි තේරුම්ගත හැකිව තිබියදීත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පසුපස ගොස් ගුරුත්වාකර්ෂණ ක්‍ෂෙත්‍රය ඇතැයි ගන්නේ සංස්කෘතික යටත්විජිතවාදයට හසුවීමෙන් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva